සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் கால சோதனை - 2026
Third Term Test

| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂයය / பாடம் / Subject | ගෘහ ආර්ථික විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 02 |
|---|---|---|---|---|---|---|---|

**උපදෙස් :**
* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* 1 සිට 50 තෙක් ඒක් ඒක් ප්‍රශ්නයට (1) (2) (3) (4) (5) යන පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුරු තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ භූදර්ශන නිර්මාණය ආරම්භය ලෙස සැලකිය හැක්කේ,
   (1) හුණු පිරියම් කළ නිවාස, රජුටද සාමාන්‍ය ජනතාවටද පරිහරණයට යොදා ගැනීම.
   (2) වරිච්චි බිත්ති, ගොම මැටි ගාන ලද පොළොව, පොල් අතු / පිදුරු යෙදූ වහළ සහිත නිවාස ඉදි කිරීම.
   (3) විවිධ හැඩතල සලකා බලා නිවාස ඉදි කිරීම.
   (4) විවිධ ලක්ෂණ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගෙන ඒවා නිසි පරිදි හසුරුවා ගනිමින් නිවාස ඉදි කිරීම.
   (5) පාරිසරික සාධක පාලනය කළ හැකි මට්ටමින් නිවාස ඉදි කිරීම.

2. කලා මූලිකාංගයක් සහ මෝස්තර මූලධර්මයක් අනු පිළිවෙලින් සඳහන් වනුයේ,
   (1) වර්ණය සහ ඒකමිතිය ය.
   (2) සමානුපාතික බව සහ තුලනය ය.
   (3) රිද්මය සහ වර්ණය ය.
   (4) රේඛා සහ වර්ණය ය.
   (5) අවධාරණය සහ වර්ණය ය.

3. හරිත සංකල්පයට අයත් මූලිකාංගයක් නොවනුයේ,
   (1) අවම ශක්ති පරිභෝජනය යි.
   (2) අවම ජල පරිභෝජනය යි.
   (3) ප්‍රවාහනය වෙනුවෙන් වැයවන ශක්තිය අවම කිරීම යි.
   (4) අපද්‍රව්‍ය අවම කිරීම යි.
   (5) කාබන් පා සලකුණු උපරිම වන ආකාරයට කටයුතු කිරීමයි.

4. තැන්පත් බව, නිශ්චල බව සහ ලාලිත්‍ය හා චලනය පිළිඹිමු කරන රේඛා අනුපිළිවෙලින් සඳහන් වන්නේ,
   (1) වක්‍ර රේඛා සහ විකර්ණාකාර රේඛා ය.
   (2) අක්වක් රේඛා සහ තිරස් රේඛා ය.
   (3) විකර්ණාකාර රේඛා සහ වක්‍ර රේඛා ය.
   (4) තිරස් රේඛා සහ අක්වක් රේඛා ය.
   (5) වක්‍ර රේඛා සහ අක්වක් රේඛා ය.

5. ධාන්‍යවල ඌන ඇමයිනෝ අම්ලය වනුයේ,

(1) මෙතියොනීන් ය. (2) ලයිසීන්ය. (3) ලියුසීන්ය.
(4) ග්ලයිසීන්ය. (5) සිස්ටීන්ය.

6. ලිපිඩ හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) හයිඩ්‍රජන් හා ඔක්සිජන් අතර අනුපාතය 2:1ට වඩා වැඩිය.
(2) පෙප්ටයිඩ බන්ධන මගින් ඒකීයව එකිනෙකට සම්බන්ධවීමෙන් සැදී ඇත.
(3) ග්‍රෑම් එකක් දහනය වීමෙන් කිලෝ ජූල් 16.7 ශක්තියක් ලැබේ.
(4) පේශිවල අන්තර්ගත ඇක්ටීන් හා මයොසීන් සංයෝගවල අඩංගු වේ.
(5) ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය වේ.

7. පහත කරුණු සලකා බලන්න.

A අන්ත්‍රයේ ඇති බැක්ටීරියා මත ක්‍රියාකර එය පැසවීම සිදුකර කෙටිදාම මේද අම්ල සාදයි.
B පිතෙහි සංඝටකයකි.
C ශරීරය තුළ $O_2$ සහ $Co_2$ පරිවහනය සිදුකරයි.
D පරිවෘත්තීය ක්‍රියා සඳහාද වැදගත් වේ.
E දේහයට නිශ්චිත හැඩයක් ලබා දේ.
මේවා අතරින් තන්තු සම්බන්ධ ප්‍රකාශය විය හැක්කේ,

(1) A ය. (2) B ය. (3) C ය.
(4) D ය. (5) E ය.

8. A නැමති පෝෂකයට බිංදු කිහිපයක් එක් කළ විට මිශ්‍රණය නිල් දම්පැහැ විය. එහිදී එක්කළ රසායනික ද්‍රව්‍ය විය හැක්කේ,

(1) සුඩෑන් III ය. (2) පොටැසියම් හයිඩ්‍රොක්සයිඩ්ය.
(3) කොපර් සල්ෆේට්ය. (4) බෙනඩික්ය.
(5) අයඩීන්ය.

9. විටමින් $B_4$ හා $B_8$ මෙහි රසායනික නාමයන් **අනුපිළිවෙලින්** සඳහන් වරණය වනුයේ,

(1) ඇඩිනොසින් සහ නියැසින්ය. (2) ඇඩිනොසින් සහ ඇඩිනින්ය.
(3) ඇඩිනින් සහ ඇඩිනොසින්ය. (4) ඇඩිනින් සහ බයොටින්ය.
(5) ඇඩිනොසින් සහ පිරිඩොක්සින්ය.

10. ඉතා දිගු ශාඛනය නොවූ හයිඩ්‍රො කාබන් දාමයකින් සමන්විත කාබනික අම්ලය මින් කුමක්ද?

(1) ග්ලූටමික් අම්ලය (2) පැන්ටොතොනික් අම්ලය
(3) ඇස්කොබික් අම්ලය (4) ෆෝලික් අම්ලය (5) ඔලෙයික් අම්ලය

11. ළමා , නව යොවුන්, වයස්ගත යන විවිධ අවධි වලදී කැල්සියම් ඌනතාවන් නිවැරදිව දැක්වෙනුයේ,

(1) අස්ථි විකෘති රෝගය , අස්ථි ක්ෂීණතාවය සහ අස්ථි මාර්දවය ය.
(2) අස්ථි ක්ෂීණතාවය, විකෘති රෝගය සහ අස්ථි මාර්දවය ය.
(3) ඔස්ටියෝ මැලේෂියා , රිකට්සියාව සහ ඔස්ටියෝ පොරෝසිස්ය ය.
(4) රිකට්සියාව, ඔස්ටියෝපොරෝසිස් සහ ඔස්ටියෝ මැලේෂියා ය.
(5) අස්ථි ක්ෂීණතාව, අස්ථි විකෘති රෝගය සහ ඔස්ටියොපොරෝසිස්ය ය.

12. ග්‍රහණිය තුළදී සිදුවන ජීර්ණ ක්‍රියාවලියක් වනුයේ,

(1) යාන්ත්‍රික ජීර්ණය ආරම්භ වීම.
(2) ආහාරය ඝන දියරයක් බවට පත්වීම.
(3) ජලය හා ඛනිජ රුධිරයට අවශෝෂණය වීම.
(4) ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වීම.
(5) අග්න්‍යාශයික යුෂ හා පිත සමඟ මිශ්‍රවී කුඩා අන්ත්‍රයට ගමන් කිරීම.

13. විටමින් A ඌනතාව හේතුවෙන් ඇති විය හැකි රෝග ඇතුළත් වරණය කුමක්ද?

(1) ශ්වසන රෝග, සරම්ප, පාචනය සහ මැලේරියාව.
(2) බිටෝලප, ඇස්වල වියළි බව, පාචනය සහ සරම්ප.
(3) තමස් අන්ධතාවය, බිටෝලප, ඇස්වල වියලිබව සහ අන්ධතාවය.
(4) ඇස්වල වියලි බව, අන්ධභාවය, සරම්ප සහ බිටෝලප.
(5) සරම්ප, බිටෝලප, තමන් අන්ධභාවය සහ ඇස්වල වියලි බව.

14. මන්ද පෝෂණය පිළිබඳ පහත සඳහන් කරුණු සලකා බලන්න.

A ලෝකයේ ප්‍රධාන සෞඛ්‍ය ගැටළුවක්ව පවතී.
B ප්‍රෝටීන් ශක්ති මන්ද පෝෂණය ආකාර දෙකකට වෙන්කළ හැක.
C මැරස්මස් තත්ත්වය වයස අවුරුදු එකට වැඩි දරුවන් අතර බහුලය.
D ක්වෝෂියෝකෝර්වල ප්‍රධාන ලක්ෂණය මුහුණ, උදරය හා පාද ඉදිමීමයි.
E ක්වෝෂියෝකෝර් ආහාරයේ ගුණාත්මක ප්‍රෝටීන් අඩංගු නොවීම හේතුකොට ගෙන ඇති වේ.

ඉහත ප්‍රකාශ අතරින් **සාවද්‍ය** ප්‍රකාශය වන්නේ,

(1) A ය. (2) B ය. (3) C ය.
(4) D ය. (5) E ය.

15. සෞඛ්‍ය ගැටළු විසඳීම සඳහා ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් ක්‍රියා කරන සිවිල් සංවිධානයක් වන්නේ,

(1) ලෝක ආහාර වැඩ සටහනය. (2) සිංහ සමාජයය.
(3) පෝෂණවේදීන්ගේ සංගමයය. (4) පෝෂණ අංශයය.
(5) වර්ල්ඩ් විෂන්යය.

16. ශරීර ස්කන්ධ දර්ශක අගය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් ඉදිරිපත් කොට ඇති B.M.I අගය 18.5 – 24.9 සඳහා දී ඇති නිර්දේශය වනුයේ,

(1) උසට අනුව බර ප්‍රමාණවත් නැත.
(2) උසට සරිලන බර ඇත.
(3) උසට අනුව බර වැඩිය, බර පාලනය කර ගත යුතුය.
(4) ස්ථූල තාවයෙන් පෙළෙන අතර දේහ බර අඩුකර ගත යුතුය.
(5) බරෙහි වෙනසක් නොමැත.

17. පහත සඳහන් පිසීමේ ක්‍රම පිළිබඳ ප්‍රකාශ සලකා බලන්න.

A සන්නයනය හා සංවහනය මගින් තාප සංක්‍රාමණය සිදු වේ.

B තද මස් පිසීම සඳහා යෝග්‍යා වේ.

C දියර අවම ප්‍රමාණයක් එක් කෙරේ.

D පෝරණුවක් තුළ හෝ ලිපක් භාවිතයෙන් මඳ ගින්නේ පිස ගත හැක.

E ක්‍රම දෙකක සංකලනයකි.

ඉහත දක්වා ඇති කරුණුවලට අදාළ ආහාර පිමසීමේ ක්‍රමය වනුයේ,

(1) පෝච් කිරීමය. (2) ග්‍රිල් කිරීමය. (3) බ්‍රේස්ට් කිරීමය.

(4) ස්ටූ කිරීමය. (5) කඩදාසි පැසක් තුළබහා පිසීමය.

18. එන්සයිමීය මැදිහත්වීමකින් තොරව ආහාරයේ අඩංගු ඔක්සිකාරක සීනි හා නිදහස් ඇමයිනෝ බාණ්ඩ තාපය හමුවේ ප්‍රතික්‍රියා කොට ආහාර දුඹුරු පැහැවීම හඳුන්වන්නේ,

(1) මෙලාඩ් ප්‍රතික්‍රියාවය. (2) කැරමලීකරණය.

(3) එන්සයිමීය දුඹුරු පැහැවීමය. (4) කැරමලාන් සෑදීමය.

(5) ෆිනෝලික සංයෝග සෑදීමය.

19. ආහාර පරිරක්ෂණයේ දුම්ගැසීමේ ක්‍රියාවලියේදී දුම්තුළ ඇති පිළිකා කාරක පොලිඇරෝමැටික් හයිඩ්‍රො කාබනය කුමක්ද ?

(1) ෆිනෝලික සංයෝගය (2) බෙන්ස් ෆයිරින්ය.

(3) ඇල්ඩි හයිඩය. (4) ප්‍රතිඔක්සිකාරකය.

(5) මෙතොක්සි ෆිනෝල්ය.

20. ආහාර ආකලන වර්ගයක් වන ඉනෝසිනික් අම්ලය,

(1) වර්ණ කාරකයකි. (2) ස්ථායිකාරකයකි. (3) ප්‍රතිඔක්සිකාරකයකි.

(4) රස ප්‍රවර්ධනයකි. (5) රස කාරකයකි.

21. අච්චාරු, දොඩම් වැනි ඉහළ ආම්ලික ආහාරවලට අදාළ pH අගය වනුයේ,

(1) 3.7 – 4.5 (2) 3.7 ට පහළය. (3) 4.5 – 5 ය.

(4) 5 හෝ ඉහළය. (5) 0.5 – 11 ය.

22. පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

* කෘතිම ඇසුරුමකි.
* වාතයට හා තෙතමනයට ප්‍රතිරෝධී වේ.
* ඉතා පහසුවෙන් හැසිරවිය හැකිය.
* ඇසුරුමේ බර අඩුය.
* සාපේක්ෂ මිල අඩුය.

ඉහත කරුණු වලට අදාළ ඇසුරුම් ද්‍රව්‍ය වනුයේ,

(1) පොලිතීන්ය. (2) පොලිප්‍රොපිලීන්ය (3) කඩදාසිය.

(4) පොලිඑතිලීන්ය. (5) ලී වර්ගය.

23. ඇගලුම් කර්මාන්ත හා ඍජුව සම්බන්ධවන වෙනත් කර්මාන්ත පමණක් ඇතුළත් වරණය වන්නේ,

(1) නූල් නිෂ්පාදනය, ලේබල් සැකසීම සහ ඉලාස්ටික් නිෂ්පාදනය.

(2) ප්‍රවාහනය, මහන යන්ත්‍ර නිෂ්පාදනය සහ ලේබල් සැකසීමය.

(3) නූල් වර්ණ ගැන්වීම, නූල් නිෂ්පාදනය සහ ප්‍රචාරණය.

(4) ඇඳුම් මුද්‍රණය, ඉලාස්ටික් නිෂ්පාදනය සහ ප්‍රවාහණය.

(5) ලේබල් සැකසීම, ප්‍රවාහනය සහ ඇඳුම් මුද්‍රණය.

24. මෝස්තර නිර්මාණය සඳහා තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර වන්නේ,

A සිල්ලර වෙළඳ පොළේ පාරිභෝගික අදහස්

B විවිධ ඇඟලුම් ආයතනයන්ගේ නිල ඇඳුම්

C ජාත්‍යන්තර මෝස්තර නිර්මාණකරුවන්ගේ අදහස්

(1) A පමණි. (2) A සහ C පමණි. (3) B පමණි.

(4) B සහ C පමණි. (5) C පමණි.

25. තනි නූලේ දම්වැල් මැස්ම හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A බොත්තම් කාස මැසීමට සහ බොත්තම් ඇල්ලීමට යොදා ගනියි.

B මැසීම සඳහා වක් වූ ඉදිකටුවක් භාවිතා කරයි.

C පහසුවෙන් ගැලවී යා හැකි මැස්මකි.

D මැස්ම අවසන් කිරීම සඳහා ආපසු මැස්ම කිහිපයක් මැසීමකි.

මින් නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය.

(4) B සහ C ය. (5) B සහ D ය.

26. පහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) හයිඩ්‍රජන් පෙරොක්සයිඩ්, රෙදිපිළි විරංජනය කිරීම සඳහා භාවිතා කරන ඔක්සිහාරක විරංජනයක් වේ.

(2) වාම් වියමන සහිත රෙදි ශක්තිමත් බවින් අඩු වේ.

(3) නයිලෝන් කෙඳි නිෂ්පාදනයේදී සෑදෙන ද්‍රාවණය, ද්‍රවායන කැටීම මඟින් කෙඳි බවට පත් වේ.

(4) හරස් ගෙතුම් ක්‍රමයට ගොතන රෙදි දික් අතට ඇදීම වැඩි වේ.

(5) ලෝම රෙදි වලට ක්ෂුද්‍ර ජීවීන්ගෙන් වැඩි හානි සිදු වේ.

27. කෙඳි වර්ගයක හරස්කඩ අන්වීක්ෂීය පෙනුම පහත රූප සටහනේ දක්වා ඇත. මෙම කෙඳි වර්ගය කුමක්ද?



(1) සේද ය.

(2) ලෝම ය.

(3) ලිනන් ය.

(4) නයිලෝන් ය.

(5) පොලියෙස්ටර ය.

28. පිලිස්සීමෙන් පසු ඉතිරිවන ද්‍රව්‍ය පබළු මෙන් දිස්වන්නේ කුමන කෙඳි වර්ගයේද?

(1) සේද ය. (2) ලිනන් ය. (3) ඩෙක්‍රෝන් ය.
(4) ඇස්බැස්ටෝස් ය. (5) සෙලියුලෝස් ය.

29. A හා B රූප සටහන්වලින් දැක්වෙන වියමන් ක්‍රම වනුයේ පිළිවෙලින්,



A B

(1) ජටා වියමන සහ වාම් වියමනය. (2) වාම් වියමන සහ ජටා වියමනය.
(3) වාම් වියමන සහ සැටින් වියමනය. (4) සැටින් වියමන සහ ජටා වියමනය.
(5) සැටින් වියමන සහ වාම් වියමනය.

30. 130 cm විශ්කම්භය සහිත වෘත්තාකාර මේස රෙද්දකට යෝග්‍ය මේස රෙද්දේ විශ්කම්භය වන්නේ,

(1) 150 cm වේ. (2) 600 cm වේ. (3) 175 cm වේ.
(4) 190 cm වේ. (5) 195 cm වේ.

31. පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් මැසීම සහ මෝස්තර ගැන්වීමේ ක්‍රම පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක්ද?

(1) සෙලියුලොස්, ප්‍රෝටීන් සහ කෘතිම රෙදි සඳහා එකම සායම් වර්ගය භාවිතා කළ හැකි වීමයි.
(2) සිදුරු තහඩු මුද්‍රණයේදී රෙද්ද මත සිදුරු තහඩුව තබා එය තුළින් රෙද්දට වර්ණ පතිත වීමට සැලැස්වීමයි.
(3) රෙදි මුද්‍රණයේදී සම්පූර්ණ රෙද්දම සායම් තුළ ගිල්වයි.
(4) මුද්‍රිත රෙද්දක ඇති මෝස්තරයක් වටා මැසීම ඇප්ලික් කිරීම යි.
(5) රෝලර් මුද්‍රණයේදී වර්ණ කිහිපයක් යෙදීම සමඟ රෝලරය භාවිතා කළ හැකි විමයි.

32. විවේක ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A නිපුණතා සංවර්ධනයට අවස්ථාව ලැබීම.
B නිවෙස් පරිසරය තුළ, පවුලේ සාමාජිකයින් සමඟ විවේකීව සිටීම.
C ක්‍රියාශීලී විවේක ක්‍රියාකාරකම් කිහිපයකි, ගුවන් විදුලියට සවන් දීම සහ සංගීතයට සවන්දීම.
D සමකාලීනයන් සමඟ සමාජශීලී වීම.

ඉහත ප්‍රකාශ අතුරෙන් ක්‍රියාශීලී විවේකයට පමණක් අදාල ප්‍රකාශයන් වන්නේ,

(1) A සහ B ය. (2) A සහ C ය. (3) A සහ D ය.
(4) B සහ C ය. (5) C සහ D ය.

33. ස්වභාවික ආකර්ෂණය සඳහා උදාහරණ වන්නේ,

(1) රබර් වතු, අලංකාර දර්ශන සහ හුම්මානය.
(2) තේ කර්මාන්තය, කෞතුකාගාරය සහ රබර්වතුය.
(3) අත්කම් භාණ්ඩ, සංස්කෘතික උත්සව සහ හුම්මානය.
(4) හුම්මානය, හික්කඩුව වෙරළ තීරය සහ උණු දිය උල්පත්ය.
(5) රබර් වතු, ජාතික විනෝද්‍යාන සහ සංරක්ෂිත ප්‍රදේශය.

34. අධ්‍යාපනික සංචරණයෙහි ලක්ෂණයක් වන්නේ මින් කුමක්ද?

(1) පර්වත තරණය කිරීම.
(2) නේවාසිකව සිටිමින් වගා බිම් නැරඹීම.
(3) පන්ති කාමරයෙන් බැහැරව සංස්කෘතික ස්ථාන නැරඹීම.
(4) වනජීවීන් සහ තුරුලතා නැරඹීම.
(5) පාරම්පරික වෙදකම් ක්‍රම මගින් ප්‍රතිකාර ලබා ගැනීම.

35. සංචරණය පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A නවීන නැමියාවකි.
B විශාල කණ්ඩායම් වශයෙන් සංචරණයේ යෙදෙයි.
C නව්‍ය අත්දැකීම් ලබා ගැනීමට යොමු වෙයි.
D සමාජයට හා පරිසරයට වන සෘණාත්මක බලපෑම් වැඩියි.

මෙහි විකල්ප සංචරණය පිළිබඳව පමණක් ප්‍රකාශ ඇතුලත් වරණය වන්නේ,

(1) A සහ B පමණි. (2) A සහ C පමණි. (3) A සහ D පමණි.
(4) B සහ C පමණි. (5) C සහ D පමණි.

36. සලකා බලනු ලබන රටෙහි ආර්ථික බල ප්‍රදේශය තුළ නේවාසිකව සිටින පුද්ගලයන් එම රටෙන් පිටතට ආගන්තුකයින් ලෙස සංචරණයෙහි යෙදීම හඳුන්වන්නේ,

(1) අභ්‍යන්තර යොමුගත සංචරණයයි. (2) දේශීය සංචරණයයි.
(3) ජාතික සංචරණයයි. (4) බාහිර යොමුගත සංචරණයයි.
(5) බාහිර සංචරණයයි.

37. ජල සැපයුම සඳහා යොදා ගන්නා උපාංග කිහිපයක් පහත දැක්වේ.

**A**



**B**



A සහ B හි කාර්යයන් පිළිවෙළින් දක්වා ඇත්තේ,

(1) නල මාර්ගයේ දිශාව වෙනස් කිරීම සහ සමාන නල සම්බන්ධ කිරීමටයි.
(2) සමාන නළ සම්බන්ධ කිරීම සහ නල මගේ දිශාව වෙනස් කිරීමයි.
(3) කරාමයක් සවිකිරීම සහ අසමාන නළ සම්බන්ධ කිරීමටයි.
(4) කපාටයක් සවිකිරීම සහ සමාන නළ සම්බන්ධ කිරීමටයි.
(5) විෂ්කම්භයෙන් අසමාන නල දෙකක් සම්බන්ධ කිරීම සහ නල මාර්ගයේ දිශාව වෙනස් කිරීමටයි.

38. පහත දැක්වෙන ගෘහීය විදුලි උපකරණවල ක්ෂමතාව ආරෝහණය වන ආකාරයෙන් දක්වා ඇති වරණය වනුයේ,

(1) ඉස්ත්‍රික්කය, රූපවාහිනිය සහ විදුලි පෝරණුව ය.
(2) ශීතකරණය, ඉස්ත්‍රික්කය සහ රූපවාහිනි ය.
(3) රූපවාහිනිය, ශීතකරණය සහ ඉස්ත්‍රික්ක ය.
(4) රූපවාහිනිය, ඉස්ත්‍රික්කය සහ ශීතකරණ ය.
(5) විදුලි පෝරණුව, රූපවාහිනිය සහ ශීතකරණ ය.

39. අඩු විදුලි ප්‍රමාණයක් වැය වන පහන් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ආලෝක විමෝචක ඩයෝඩ පහන් සහ සූත්‍රිකා පහන්ය.
(2) සූත්‍රිකා බල්බ සහ සුසංහිත ප්‍රතිදීපන පහන් ය.
(3) සූත්‍රිකා බල්බ සහ ප්‍රතිදීපන පහන් ය.
(4) ආලෝකය විමෝචක ඩයෝඩ පහන් සහ ප්‍රතිදීපන පහන් ය.
(5) ආලෝක විමෝචක ඩයෝඩ පහන් සහ සුසංහිත ප්‍රතිදීපන පහන් ය.

40. නිවසක විදුලි පරිපථයේ අලුත් වැඩියාවක් සිදු කිරීමේදී නිවසේ සියලු පරිපථවලට ලැබෙන විදුලිය විසන්ධි කළ හැක්කේ,

(1) වෙන්කරණයෙනි.
(2) ශේෂ ධාරා පරිපථ බිඳිනයෙනි.
(3) සිහිති පරිපථ බිඳිනයෙනි.
(4) අධි ධාරා පරිපථ බිඳිනයෙනි.
(5) විලායකයෙනි.

41. පුනර්ජනනීය නොවන සම්පත් පිළිබඳ නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) අවශ්‍යතා සපුරා ගැනීම සඳහා නැවත භාවිතයට ගතහැකි වීම.
(2) අවම ජනනය වීමේ හැකියාවක් සහිත සම්පතක් වීම.
(3) ස්වාභාවික සම්පත් වීම.
(4) ක්ෂය කළ නොහැකි සම්පතක් වීම.
(5) දිගු කාලයකදී ජෛව ප්‍රජනක ක්‍රියා මඟින් ප්‍රතිස්ථාපනය කළ හැකි වීම.

42. ආහාර පා සලකුණු අවම කර ගැනීමට ක්‍රියාත්මක නොවිය යුතු ආකාරයක් වන්නේ,

(1) ආහාර පා සලකුණු අගය වැඩි ආහාර පරිභෝජණය අවම කිරීමය ය.
(2) තම ප්‍රදේශවල නිෂ්පාදිත ආහාර පරිභෝජනය කිරීමය ය.
(3) ගැස් උදුනේ නිල්දැල්ල භාවිත කිරීමය ය.
(4) වැඩිපුර මිලදීගත් ආහාර ශීතකරන තුළ ගබඩා කිරීමය ය.
(5) කාලීන එළවලු පලතුරු භාවිතයට ගැනීමය ය.

43. පාංශු වසුන් ලෙස යොදා ගත හැකි ශාක දෙවර්ගයක් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) කොහොඹ සහ ගම්මාලු
(2) කහ සහ කෝමාරිකාරයා
(3) උඳුපියලිය සහ එනසාල්
(4) උඳුපියලිය සහ තිප්පිලි
(5) හාතවාරිය සහ පොල් පලා

44. උපද්‍රවකාරී නොවන අපද්‍රව්‍යකි.

(1) පරණ ගෑස් ටැංකිය
(2) කෘෂි රසායනය
(3) ඩයි වර්ගය
(4) ඉලෙක්ට්‍රොනික උපාංගය
(5) දහයියා ය.

45. ස්ටොට් විසින් සිදුකළ නව යොවුන් වියේ අනු අවධි බෙදීමට අනුව යෞවනෝදයට අයත් වයස් සීමාව වන්නේ,

(1) අවුරුදු 15 – 16 ය. (2) අවුරුදු 16 – 20 ය. (3) අවුරුදු 10 – 13 ය.
(4) අවුරුදු 10/11 සිට 14 ය. (5) අවුරුදු 16 – 21 ය.

46. නව යෞවනයා මුහුණ දෙන ප්‍රධාන ගැටලු වලට අමතරව වර්තමානයේ නව යෞවනයා මුහුණ දෙන ගැටලුවක් වන්නේ,

(1) නව රැල්ලේ ගීත හා ඊට අදාළ රූප රචනාය.
(2) තාක්ෂණික මෙවලම් පැමිණීමත් සමග රැකියා අවස්ථා අඩුවීමය.
(3) දෙමව්පියන්ගේ දැඩි බලාධිකාරිත්වය ය.
(4) සියල්ලන්ම නොරුස්සන ස්වභාවය ය.
(5) දැඩි තරගකාරී අධ්‍යාපන රටාව ය.

47 මානසික සමබරතාවයේ ප්‍රධානතම ලක්ෂණය ලෙස සැලකිය හැක්කේ,

(1) සිත එකඟ කර ගැනීමට පහසුවීමයි.
(2) ගැටලු වලට සාර්ථකව මුහුණ දීමට හැකිවීමයි.
(3) මාංශ පේශීන්ගේ මනා පිහිටීමකින් යුක්ත වීමයි.
(4) මානසික ආබාධයන්ට ගොදුරු නොවී සිටීමේ හැකියාවයි.
(5) ඉදිරිපත් වීමේ කුසලතාවෙන් යුක්ත වීමයි.

48. ළමා මානසික නිරෝගීතාව වර්ධනය සඳහා ගත හැකි පියවර කිහිපයක් පහතින් දැක්වේ.

A ක්‍රීඩා කිරීමට අවස්ථා ලබා දීම.
B නව අත්දැකීම් සඳහා අවස්ථා ලබා දීම.
C කණ්ඩායම් තුළ වැඩ කිරීමට අවස්ථාව ලබා දීම.
D අවතැන්වීම.
E විවේකය හා විනෝදය.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි පියවර වන්නේ,

(1) A B C සහ D පමණි. (2) A B C සහ E පමණි. (3) A B සහ E පමණි.
(4) B C සහ D පමණි. (5) D සහ E පමණි.

49. "හෙළ සළු" ඇඟලුම් කර්මාන්ත ආයතනයේ සාරි නිෂ්පාදනයේ දී යොදා ගත් යෙදවුම් ප්‍රමාණය 1500කි. නිමැවුම් ප්‍රමාණය 750 කි. මෙම කර්මාන්ත ශාලාවේ ඵලදායිතාව නිවැරදිව දැක්වෙන්නේ,

(1) 0.4 කි. (2) 0.5 කි. (3) 0.8 කි.
(4) 0.9 කි. (5) 0.95 කි.

50. ව්‍යාපාරයක පවතින අභ්‍යන්තර ආචාර ධර්මයක් සහ බාහිර ආචාර ධර්මයක් පිළිවෙලින් දැක්වෙනුයේ,

(1) සේවක අයිතිවාසිකම් සහ ගුණාත්මක පාලනය ය.
(2) සාධාරණ මිල ප්‍රතිපත්තිය සහ සාධාරණ නිෂ්පාදනය ය.
(3) ව්‍යාපාර නීති සහ ගුණාත්මක පාලනය ය.
(4) සාධාරණ මිල ප්‍රතිපත්ති සහ සේවක අයිතිවාසිකම් ය.
(5) ව්‍යාපාර නීති සහ සාධාරණ නිෂ්පාදනය ය.